ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

அனர்த்த முகாமைத்துவ அமைச்சு

# MINISTRY OF DISASTER MANAGEMENT


විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.

வித்யா மாவத்தை, கொழும்பு 07, இலங்கை.

Vidya Mawatha, Colombo 07, SRI LANKA.

| | | | | |
|---|---|---|---|---|
| ය / ச்சர் / ter | ෆැක්ස් / பக்ஸ் / Fax | ලේකම් / செயலாளர் / Secretary | ෆැක්ස් / பக்ஸ் / Fax | ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / General Office — 2665352 | ෆැක්ස් / பக்ஸ் / Fax — 2665098 |


මගේ අංකය / எனது இல / My No. — NDRSC/1/2/3/NITF-02

ඔබේ අංකය / உமது இல / Your No. —

දිනය / திகதி / Date — 2017.12.04

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
රත්නපුර / ගාල්ල

**<u>අධික වැසි සහ අධික සුළං හේතුවෙන් හානියට පත් වතු නිවාස සඳහා ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ සහන සැලසීම.</u>**

උක්ත කරුණට අදාළව කහවත්ත ප්‍රාදේශීය ලේකම්ගේ අංක KHDS/SOD/DM/04/WDSD/05, 2017.12.03 දිනැති ලිපිය හා 2017.12.02 වෙනි දින ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රධාන විධායක නිලධාරී සමඟ පැවති දුරකථන සාකච්ඡාව හා බැඳේ.

2017.11.29 වෙනි දින බලපෑ හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් ඔබ දිස්ත්‍රික්කය තුළ විපතට පත් වතු නිවාසවල (වතු ලයිම කාමරවල) පදිංචි ජනතාවගේ ජනජීවිතය නගා සිටුවීම සඳහා හානියට පත් වතු නිවාසවල වහල පිළිසකර කරගැනීම වෙනුවෙන් ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රමවේදවලින් එක් ක්‍රමවේදයක් යටතේ සහන සැලසීම සිදු කළ හැකි බව කාරුණිකව දන්වමි.

01. හානියට පත් වතු නිවාසවල වහල පිළිසකර කරගැනීම සඳහා රු.10,000.00 ක උපරිමයකට යටත්ව අදාළ ප්‍රතිලාභීන් වෙත රක්ෂණ වන්දි පිරිනැමීම.

    හෝ

02. වතු නිවාසවල පදිංචි ජනතාවගේ හානියට පත් වතු නිවාසවල වහළ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය වන සෙවිලි තහඩු ප්‍රමාණය ලබා දී එම මිලදී ගැනීම්වලට අදාළ බිල්පත් ජාතික රක්ෂණ භාර අරමුදලින් ප්‍රතිපූර්ණය කිරීම.

මෙම ක්‍රමවේද දෙකෙන් එක් ක්‍රමවේයක් යටතේ පමණක් හානියට පත් වතු නිවාස හිමියන් වෙත රක්ෂණ වන්දි මුදල් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර එම නිවාස හානිවූවන්ගේ පදිංචිය අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ගෙවීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දෙන ලෙසත් අදාළ ප්‍රතිලාභී නාම ලේඛන, ජා.ආ.ස.සේ.ම. 09 V අයදුම්පත් හා සෙවිලි තහඩු මිලදී ගැනීම්වලට අදාළ බිල්පත්වල මුල් පිටපත් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත එවීමට කටයුතු සිදු කරන ලෙස කාරුණිකව වැඩිදුරටත් දන්වා සිටිමි.

අයි.සී.පතිරාජ
අධ්‍යක්ෂ

අත්. කළේ,
එම්. කිංස්ලි ප්‍රනාන්දු
ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත්:

| | | | |
|---|---|---|---|
| 01. | සනත් ද සිල්වා මහතා, ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල | - | ඔබ සමඟ පැවති දුරකථන සාකච්ඡාව අනුව කරු. දැනගැනීම සඳහා |
| 02. | ලේකම්, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 03. | ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |

222236
222420
222142
222141